# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2292/04 - 2022 අගෝස්තු මස 08 වැනි සඳුදා - 2022.08.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: DIK/LAN/02/62.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :-

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 456 B, බෝදරකන්ද ග්‍රාම නිලධාරි වසමේ බෝදරකන්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි. මාර 2897 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස:

01. **කැබලි අංකය 01**

ඉඩමේ නම: දවටගහවත්ත; විස්තරය: ගෙවත්ත, වයස අවු. 10-20 පමණ වූ මිශ්‍ර වගාවක් ද, ස්ථිර ගොඩනැගිල්ලක් ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද, වතුර ටැංකි 2ක් සහ වැසිකිලියක් ඇත; හිමිකම් කියන්නේ: මෙරෙඤ්ඤ සෝමසුන්දර නොහොත් මෙරෙඤ්ඤ සෝමදාස, කිරිලියනගෙවත්ත, වත්තේගම දකුණ, දික්වැල්ල; ප්‍රමාණය: හෙක්. 0.5611.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 සැප්තැම්බර් මස 07 වැනි දින පූ.භා 10.30 ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී, මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 සැප්තැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2022 අගෝස්තු මස 01 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
දික්වැල්ල.

EOG 08-0046


1A - G 37183– 16 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*